www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයේ දස දහස් ගනන් සංක්‍රමනික වැටලීම්වලට එරෙහිව පෙලපාලි යති

## Tens of thousands march against immigration raids in the US

**රෆායල් අසුල්**
**2008 මැයි 3**

ලේඛනගත නොවූ කම්කරුවන්ගේ සහ අනෙකුත් සියලුම සංක්‍රමනිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට දස දහස් ගනන් කම්කරුවෝ සහ ශිෂ්‍යයෝ මැයි පලමුවනදා එ.ජ. නගර ගනනාවකදී පෙලපාලි ගියහ. ලොස් ඇන්ජලිස්හිදී සහ වොෂින්ටන්, මිල්වුකී, නිව්යෝක්, චිකාගෝ, සියැටල්, බොස්ටන්, හූස්ටන්, ඩලාස් සහ ඩෙට්‍රොයිට් ඇතුලු නගර ගනනාවකදී පෙලපාලි පවත්වන ලදී.

රජයේ කම්හල් වැටලීම් පෙලපාලිකරුවන්ගේ චෝදනාවට ලක් වූ අතර එක්සත් ජනපදය තුල ජීවත්වන මිලියන 12 කට අධික ලේඛනගත නොවූ කම්කරුවන් නීතිගත කරන ලෙස බල කෙරිනි. බොහෝ විරෝධතාකරුවන් අත ලේඛනගත නොවූ කම්කරුවන්හට රියදුරු බලපත් ලබාදෙන ලෙස ඉල්ලීම්ද, ඉහල තෙල්මිල ගනන් දෝෂ දර්ශනයට ලක්කිරීම්ද, සහ ඉරාක යුද්ධය අවසන් කරන ලෙස ඉල්ලීම්ද, සහිත පෝස්ටර් දක්නට ලැබින. ලේඛනගත නොවූ බැවින් තමන්ම විරෝධතා දැක්වීමට ඇති බිය හේතුවෙන් ලේඛනගත නොවූ ඥාතීන්ද සමග බොහෝ නෛතික පුරවැසියන් පෙලපාලියට එකතු වුනි.

කම්කරු සහයෝගීතාවයේ ජාත්‍යාන්තර දිනය සමග සමපාතවෙමින් පැවතුන පෙලපාලි, 2006 දී පැවතුන පෙලපාලි වලට වඩා බොහෝ කුඩා විය. 2006 දී, එ.ජ. යේ ලේඛනගත නොවූ කම්කරුවන් බරපතල අපරාධකරුවන් බවට පත්කර බන්ධනාගාර ගතකරන්නට එ.ජ. නියෝජිත මන්ත්‍රී මංඩලය විසින් නීති සම්පාදනය කිරීමට එරෙහිව විරෝධය පලකරන්නට ලොස් ඇන්ජලිස් සහ චිකාගෝ හිදී මිලියන 1.5 ක කම්කරුවන් සමග දස දහස් ගනනක් 100 කට ආසන්න අනෙකුත් නගරවලදී අත්වැල් බැඳගත්හ. වීසා රහිත සංක්‍රමනිකයන් හට යම් කිසි සේවාවක් සැපයීම වෙනුවෙන් වෛද්‍ය වෘත්තිකයින්, සමාජ සේවකයින් සහ ගුරුවරුන් ඇතුලු ඕනෑම එ.ජ. වැසියෙකුව එම පනතින් අපරාධ කරුවෙකු කල හැකියාව තිබිනි.

ලොස් ඇන්ජලිස්හි 10,000 ක් පමනද නිව්යෝර්ක් නගරයේ 5,000 කට අඩුවෙන්ද පෙලපාලියට එක්වීමෙන් ඉහත තත්වයට විකල්පව මෙවර සංඛ්‍යාව ඉතාම අඩුවිය. හූස්ටන් සහ සැන් ෆ්‍රැන්සිස්කෝ හිදී, සිය ගනනක් පමනක් එක්වෙන අතරේදී තරමක් විශාල විරෝධතා චිකාගෝ සහ මිල්වුකී හිදී පැවත්විනි. බොහෝ සංක්‍රමනික පෙලපාලි කරුවන් මෙක්සිකෝ සහ මධ්‍යම ඇමරිකාවෙන් පැමිනවුන් වූ අතර අනෙකුත් සහභාගිවූවන් කැරිබියානු, දකුනු කොරියා සහ පිලිපීනයෙන් පැමිනියවුන්ය.

පසුගිය වසර පුරාවට රජය විසින් ක්‍රියාත්මක කරන ලද වාර්තාගත රටින් නෙරපාහැරීම් සහ සංක්‍රමනික වැටලීම් සංඛ්‍යාව මගින් සහ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම හා ජන මාධ්‍ය විසින් උත්කර්ෂයට නැංවුන ලේඛනගත නොවූ කම්කරුවන් අමානුෂික කර පෙන්වා කොන් කිරීම මගින් උපදවන ලද භයංකර වාතාවරනය, විරෝධතාකරුවන්ගේ සැලකිය යුතු සංඛ්‍යාත්මක පහලයාමට හේතු වුන බවට සැකයක් නැත. එ.ජ. ආගමන සහ රේගු බලාධිකාරිය විසින් සටහන් ගත කල සංඛ්‍යාවලට අනුව, 2005 සිට එ.ජ. තුලින් නෙරපීම් සියයට 60 ආසන්නය දක්වා ඉහල නැග තිබේ.

ඒ අතරේදී, මිලියන 11 කට ඇස්තමේන්තු ගතකර ඇති මැක්සිකානු සංක්‍රමනිකයින් උතුරේ රැකියා සොයා යද්දී ඔවුන්ගේ පවුල් වලින් ඔවුන් වෙන් කර තැබීමට එ.ජ.-මැක්සිකානු දේශ සීමාව ආසන්න ලෙසට මිලිටරීකරනය කිරීම බලපා ඇත.

සංක්‍රමනික කම්කරුවන්ගේ රැකියා සැපයීමේ ප්‍රධානතම මාර්ගය වන ඉදිකිරීම් රැකියා, ගැඹුරුවන ආර්ථික අර්බුදය මගින් විශේෂිතවම ප්‍රහාරයකට ලක්වූ බැවින්, කම්කරු පංතියේ මෙම කොටසට තදබල ලෙස පහර වැදුනේය. පෙලපාලි ආරම්බ වන අවස්තාව ආසන්නයේදී, කඩාවැටෙන ආර්ථික තත්වයන්ගේ ප්‍රතිපලයක් ලෙස එ.ජ. යේ මිලියන 3 ක් පමන වන ලතින් ඇමරිකානු සංක්‍රමනිකයින්, අවසාන වර්ෂ දෙක තුලදී තම පවුල් වලට මුදල් යැවීම නතර කර දමා ඇති බව අන්තර් ඇමරිකානු සංවර්ධන බැංකුව වාර්තා කලේය.

මේ අතරතුරදී, එ.ජ. ලේඛනගත නොවූ සංක්‍රමනිකයන් අපරාධකරුවන්කොට උසාවි යැවීම සඳහා ඊලග සතියේදී නව පනතක් හඳුන්වා දීමට රිපබ්ලිකන් සෙනට් සභිකවරු සූදානම් වෙමින් සිටිති,

දේශසීමා හරහා යද්දී අල්ලා ගන්නා සංක්‍රමනිකයන් සිරගතකිරීමටද, ලේඛන ගත නොවූවන් බැංකු ගිනුම් ආරම්භ කිරීමට එරෙහිව බාධා පමුනුවන්නටද, සියලුම දෙනා ෆෙඩරල් ආයතන සමග පනිවුඩ හුවමාරුවේදී ඉංග්‍රීසි භාෂාවෙන් කිරීමේ අවශ්‍යතාවය තහවුරු කිරීමටද, යෝජිත පනතින් වරම් ලැබෙනු ඇත. ලේඛනගත නොවූ සංක්‍රමනිකයන් හට රියදුරු බලපත් සපයන ප්‍රාන්ත සහ සංක්‍රමනික බාවය මත මිනිසුන් අත් අඩංගුවට ගන්නට පොලිස් පිලධාරීන්හට ඉඩ නොදෙන නගර සඳහා ෆෙඩරල් ප්‍රතිපාදන කපා හරින්නට පනත යෝජනා කරයි.

පෙලපාලි දැක්වූවන් එසේ කලේ මෙම මර්ධන රැල්ලට විරෝධය පලකිරීම පිනිසය, ලොස් ඇන්ජලිස්හිදී, මේ වසර මුල රජයේ වැටලීමට ලක්වූ කර්මාන්තශාලාවක කම්කරුවන් සමග එක්ව, 700 කට අධික උසස් පාසල් ශිෂ්‍යයෝ විරෝධතාවයට එක්වූහ.

මිල්වුකීහිදී, සංක්‍රමනික වැටලීම් වලට විරුද්ධ ස්ථාවරයක් ගන්නැයි ඩිමොක්‍රටික අපේක්ෂකවරුන් වන ක්ලින්ටන් සහ ඔබාමාගෙන් ඉල්ලමින් පෙලපාලිකරුවෝ සටන් පාඨ කියූහ. 2006 සිට, එ.ජ. ආන්ඩුවේ ආගමන සහ රේගු බලාධිකාරිය (අයි.සී.ඊ.) විසින් මිනසෝටා සහ ඉයෝවා වල මස් ඇසුරුම් ෆැක්ටරි, සංක්‍රමනික වැටලීම් සඳහා ආක්‍රමනශීලීව ඉලක්කගත කරනු ලැබ ඇත.

මේ වසරේ උද්ඝෝෂනයේදී, ඡන්ද ලියාපදිංචි කිරීම සහ ඉදිරියේදී පැවැත්වෙන මැතිවරන ගැන සංවිධායකයෝ අවධාරනයක් දැක්වූහ. ලොස් ඇන්ජලිස් ටයිම්ස් පුවත් පතට අනුව, කොඇලිෂන් ෆෝ හියුමන් ඉමිග්‍රන්ට් රයිට්ස්, වී ආ ඇමෙරිකා එලයන්ස්, සහ එස්.ඊ.අයි.යූ. වැනි ඩිමොක්‍රටික පක්ෂයට සහාය දක්වන කන්ඩායම්, නෛතික සංක්‍රමනිකයන් එ.ජ. පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරවන්නට හා ඡන්දය දැමීම සඳහා ලියාපදිංචි කරවීමට උනන්දු කරවන්නට අවධානය යොමුකර ඇත. චිකාගෝහි පැවති විරෝධතාවයෙහිදී, මෙම කාරනාව සම්බන්ධයෙන් ප්‍රබල වැඩසටහනක් ඉදිරිපත් කරන කුමන හෝ අපේක්ෂකයෙකුට තමන් ඡන්දය දෙන බව සමහර කම්කරුවෝ සඳහන් කලහ.

මෙය අවෘත අන්තයක් සහිත උපායමාර්ගයක් බව තහවුරු වනු ඇත. සංක්‍රමනිකයන් මැඩලීම නිමාකරන සහ කම්කරුවන් ලෙස ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ලබාදෙන ඉලක්කගත ප්‍රතිපත්ති ඉදිරියට ගෙනයන නැඹුරුවක්, ඩිමොක්‍රටික පක්ෂයේ ජනාධිපතිවරන නාමයෝජනා සඳහා තරග වදින සෙනෙට් සභික බැරැක් ඔබාමා සහ හිලරි ක්ලින්ටන් හෝ රිපබ්ලිකන් අපේක්ෂක සෙනෙට් සභික ජෝන් මැක්කේන් පෙන්වා නැත.

දේශසීමා බලාත්මකකිරීම සහ සංක්‍රමනිකයන්ට අපරාධ චෝදනාවෙන් සැලකීම (ඇය ක්ෂනික් පිටුවහල්කිරීම සඳහා පෙනී සිටී.) සම්බන්ධව ක්ලින්ටන් තදබල වාගාලාප එකතුකරන අතර, කෘෂි ව්‍යාපාර සහ අනෙකුත් අංශවල හාම්පුතුන්ට ලාභ ශ්‍රමය ස්ථිරව සැපයීම සහතික කරන ආගන්තුක කම්කරු වැඩසටහනක යම්කිසි ආකෘතියක් සඳහා සහයෝගය දක්වයි. මෙම කාරනාව සම්බන්ධව ක්ලින්ටන් සමග ඔබාමාගේ ප්‍රධාන අසම්මුතිය වන්නේ, ලේඛනගත නොවූ සංක්‍රමනිකයන්හට රියදුරු බලපත් ලබාදීම ගැනය. ඇය බලපත් ලබාදීමට විරුද්ධය, ඔහු ඊට පක්ෂය.

ආගන්තුක කම්කරු වැඩසටහනේ හිටපු ආධාරකරුවෙකු වන රිපබ්ලිකන් පාර්ශවයේ මැක්කේන් දැන්, මැක්සිකෝව සමග වන එ.ජ. දේශසීමාව වසාදමන්නට සහයෝගය දක්වයි.

විරෝධතා සම්බන්ධව ඇයගේ අදහස් පැවසීමේදී, තමා පත්වී පලමු දින 100 ඇතුලතදී, සංක්‍රමනික පනතක් ඉදිරිපත් කිරීමට ක්ලින්ටන් පොරොන්දු වූවාය. සෙනට් සභික ඔබාමා, කිසිඳු ස්ථිරසාර යෝජනාවක් ගෙනඒමෙන් වැලකී සිටි අතර, ඒ වෙනුවට ඡන්දය දීමට ලියාපදිංචි වෙමින් තමන්ගේ ඉල්ලීම් සඳහා සටන් කරන්නට සියලුම සංක්‍රමනිකයන්ගෙන් ඉල්ලා සිටියේය.

පවතින සංක්‍රමනික ප්‍රතිපත්තියෙහි මානුෂීය වටිනාකම කිසිඳු අපේක්ෂකයෙකු බරපතල ලෙස විමසා නැත. 1994 දී ජනාධිපති ක්ලින්ටන් යටතේ, මුරකාර මෙහෙයුම ස්ථාපිත කලායින් පසුව එ.ජ.-මැක්සිකානු දේශ සීමාව පසුකිරීමෙන් 4000 කට අධික සංක්‍රමනිකයන් ගනනක් මියගියහ. ද්වි-පාක්ෂික වැඩසටහනක් වූ මෙම මෙහෙයුම, මැක්සිකෝවෙන් සහ මධ්‍යම ඇමරිකවෙන් එන සංක්‍රමනිකයන් ප්‍රවේශය තදබල ලෙස අවම කරන්නට සකස් කරන ලද්දක් වන අතර, සංක්‍රමනිකයන්ගේ අනිවාර්ය ප්‍රවාහය, දඩුවම් දෙන කාන්තාරයට හරවා යවන්නට උදව්දුන්නේය.

එතැන් පටන්, ඩිමොක්‍රටින සහ රිපබ්ලිකන් දේශපාලකයෝ එකාවන්ව එ.ජ. ව්‍යාපාරයන්ගේ ලාභ අවශ්‍යතාවය සඳහා කම්කරු පංතියේ මෙම කොටසෙහි මිනිස් අයිතිවාසිකම් පාගා දමමින් සංක්‍රමනිකයන්ගේ සංචලනය තවදුරටත් යටපත් කරන්නට ක්‍රියා කලහ.

ඔබාමා සහ ක්ලින්ටන් වැනි ඩිමොක්‍රටික ලිබරලුන් යැයි කියනු ලබන්නන් සම්බන්ධව සහ මැක්කේන් වැනි අති දක්ෂිනාංශිකයින්ගේ සෙනොෆෝබියාවට (විදේශිකයින් නුරුස්නා බවට) ආයාචනා කරන්නට උත්සාහ කරන්නන් යන දෙගොල්ලන්ගේම තත්වය මෙයයි.

කැලිෆෝනියාවේ සහ රටපුරා අනෙකුත් ප්‍රදේශයන්හි, කෘෂිකර්මාන්ත, ඉදිකිරීම් සහ සැහැල්ලු නිෂ්පාදන වල යෙදී සිටින ව්‍යාපාර, සංක්‍රමනිකයන් මතට වැඩිවන රජයේ වැටලීම් සහ සාමාන්‍යකෘත කඩාපැනීම් ගැන සිය සැලකිල්ල උත්සන්න කිරීමට පටන් ගෙන ඇත. ලොස් ඇන්ජලිස් ටයිම්ස් වලට අනුව, ෆැක්ටරි වැටලීම් 4900 ක්, එනම් 2001 දීට වඩා 21 වාරයක්, පසුගිය වසරේ සිදුවිය. 2001 සහ 2007 අතරේදී, ලේඛන ගත නොවූ සංක්‍රමනිකයන් අත්අඩංගුවට ගැනීම් සියයට 870 දක්වා, එනම් 510 සිට 4940 තෙක්, පිම්මක් පැන්නේය. සමහර අවස්ථාවලදී, තම දරුවන් අතරමංවන්නට ඉඩ හැර තනි මාපියන් හට නැවත ගෙදර පැමිනීමට නොහැකිවිය.

ලොස් ඇන්ජලිස් ප්‍රාන්තයේ මේ වසරේ දූසිමකට වැඩි වැටලීම් සිදුවුනේය. වැන් නයිස් නාගරික පෙදෙසේදී, ඉන්ක්-ජෙට් නිෂ්පාදකයෙක් වන මයික්‍රෝ සොලුෂන්ස් වටලා සංක්‍රමනිකයන් 130 ක් අත් අඩංගුවට ගන්නා ලදී. සංක්‍රමනික වැටලීම්වල ප්‍රතිවිපාක ලෙස, ගෘහ භාන්ඩ, ආහාර සහ මෝස්තර කර්මාන්ත වල සමාගම් සමහරකට හෝ ප්‍රාන්තය අතහැර යාමට බල කෙරුන හොත් දස දහස් ගනන් රැකියා නැතිවිය හැකි බව, ලොස් ඇන්ජලිස් ප්‍රාන්ත සංවර්ධන සංස්ථාව මගින් මෑතකදී සිදුකල අධ්‍යයනයකදී සොයාගෙන ඇති අතර, එහි ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ජැක් කයිසර්ට අනුව, මෙම තත්වය ව්‍යාපාර සඳහා යෝග්‍ය නොවනු ඇත.

විරෝධතා පැවතුනද, අයි.සී.ඊ. වැටලීම් දිගටම පවතිනු ඇත. දේශය පුරාවටම සංක්‍රමනිකයන්ගේ රැස්වීම් පැවතියේ වුවද දේශීය ආරක්ෂක දෙපාර්තමේන්තු ප්‍රධානී මයිකල් චර්ටොෆ්, තම දෙපාර්තමේන්තුවේ මතය පලවන ලීඩර්ෂිප් ජර්නල් හි මෙසේ සිය අදහස් ගොනු කලේය. "නීති විරෝධී සංක්‍රමනික කාරනාවේදී, අවුරුදු 30 ක් වචනයෙන් පමනක් මත පැවසීම ගැන ඇමරිකානු ජනතාව කලකිරීමෙන් සිටිති. ඔවුනට අපේ නීතිය බලාත්මක කරන්නට අවශ්‍ය වේ. නීතිය මගින් පවරා ඇති සියලුම මෙවලම් භාවිතා කරමින්, එම වරම ක්‍රියාවේ යොදවන්නට මම මගේ දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇත්තෙමි." තම දෙපාර්තමේන්තුව "නීති විරෝධී කම්කරුවන්හට රැකියා ලබාදීමට විරුද්ධව ඇති නීති සමග අනුකූල වන අයුරින් ව්‍යාපාර මෙහෙයවන " අතර," අපි නීති විරෝධී ලෙස මෙහි සිටින්නවුන් සොයාගත්විට අයි.සී.ඊ. ය ඔවුන් ඉවත් කරනු ඇතැ"යි ඔහු සඳහන් කලේය.

© www.wsws.org